අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 +94112784846
isurupaya@moe.gov.lk www.moe.gov.lk

මගේ යොමුව / எனது இல. / My Ref. ED/05/67/28/05(1- වෙළුම) ඔබේ යොමුව / உமது இல. / Your Ref. දිනය / திகதி / Date 2019.12. 31

පියාධිපතිවරුන්,
විදුහල්පතිවරුන්,
ගුරු විදුහල්පතිවරුන් හා
ගුරු මධ්‍යස්ථාන කළමනාකරුවන්,

**2020 වාර්ෂික ස්ථාන මාරුවීම් - අධ්‍යාපන අමාත්‍යාංශයෙන් පත් කරන ලද අනධ්‍යයන කාර්ය මණ්ඩලවලට අයත් නිලධාරීන්**

මේ සමඟ අමුණා ඇති උපලේඛනයේ සඳහන් මාරුවීම් **2020.02.17** දින සිට ක්‍රියාත්මක වන පරිදි අනුමත කරමි. මේ බව අදාළ නිලධරයන් වෙත දන්වා නියමිත දිනයේදී අභිනව කාර්ය ස්ථානයේ වැඩ භාර ගන්නා ලෙස ඔවුන්ට දැනුම් දෙනු මැනවි.

02. මෙම ස්ථාන මාරුවීම් සිදු කිරීමේදී මාරුවීම් කමිටුව විසින් අනුගමනය කරන ලද ස්ථාන මාරු පටිපාටිය, 2019.06.25 දිනැති අංක 32/2019 දරන අධ්‍යාපන චක්‍රලේඛය සමඟ මේ වන විටත් ඔබ වෙත එවා ඇත. මේ සමඟ ඇති ස්ථාන මාරුවීම් නියෝග, මාරුවීම් ඉල්ලා තිබූ සියළුම නිලධරයන්ට දැනගැනීමට සැලැස්විය යුතු වේ. මෙම ස්ථාන මාරු නියෝගවලට යටත් නිලධරයෙකුට 2019.12.31 දින දක්වා කල් දමන ලද හෝ මෙතෙක් ක්‍රියාත්මක නොවූ මීට ඉහතදී නිකුත් කර ඇති ස්ථාන මාරු නියෝගයන් වේ නම් එවැනි නිලධරයෙකුට නැවත 2020 වාර්ෂික ස්ථාන මාරු නියෝග මඟින් වෙනත් ස්ථාන මාරු නියෝගයක් ලබාදී ඇත්නම් පමණක් පෙර ස්ථාන මාරු නියෝග බල රහිත වන බව සලකන්න.

03. ඉහත චක්‍රලේඛයේ විධිවිධාන පරිදි වාර්ෂික ස්ථාන මාරුවීම් ප්‍රතිපත්තියට අනුව 2020 වර්ෂය සඳහා ස්ථාන මාරුවීම් නියෝග නිකුත් කරන ලද නිලධාරීන්ගේ ස්ථාන මාරු නියෝග / නියෝගය 2020.02.17 දින සිට ක්‍රියාත්මක වේ. අදාල ස්ථාන මාරු නියෝග ලැබී ඇති නිලධාරීන් 32/2019 දරන අධ්‍යාපන චක්‍රලේඛයේ 7.3 හා 7.4 වගන්තිවලට (රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටි 214, 215, 216 හා 217) අනුව අනුප්‍රාප්තිකයන් පැමිණෙන තෙක් රඳවා නොගෙන නියමිත දින නව සේවා ස්ථානයේ රාජකාරි භාර ගැනීමට හැකිවන පරිදි විධිමත්ව ආයතනයේ රාජකාරි කටයුතුවලින් මුදාහැරීමට කටයුතු කළ යුතුය. මෙම ස්ථාන මාරුවීම් නියෝග පැහැර හැර සිටින නිලධාරීන් සම්බන්ධයෙන් 32/2019 අධ්‍යාපන චක්‍රලේඛයේ 7.8 වගන්තිය අනුව කටයුතු කල හැකි බවද දන්වමි.

04. මෙම ස්ථාන මාරුවීම් නියෝග සම්බන්ධයෙන් අභියාචනා ඉල්ලීම් ඉදිරිපත් කරන නිලධාරීන් වේ නම් 2020.01.17 දිනට පෙර මේ සමඟ අමුණා ඇති රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතීන් 209 හි 14 පරිශිෂ්ඨය පරිදි අභියාචනා සකස් කර (ජාතික හැඳුනුම්පත් අංකයද සඳහන් කර) මා වෙත ඉදිරිපත් කළ යුතු බවත් කාරුණිකව දන්වමි.

05. එමෙන්ම, ඉහත 04 ඡේදයේ සඳහන් කාල සීමාව තුළදී අමුණා ඇති ආකෘති පත්‍රයට අනුව සකස් කර ඉදිරිපත් කර නොමැති අභියාචනා ඉල්ලීම් ප්‍රතික්ෂේප කරනු ලබන බවත් වැඩිදුරටත් කාරුණිකව දන්වමි.

එන්.එච්.එම්. චිත්‍රානන්ද
අධ්‍යාපන ලේකම්